

# දයා පතිරණ සහ බලෙන් හිරු නැංවීම

ර. චන්ද්‍රසූරිය
<ra.chandra.suriya@gmail.com>

**දයා පතිරණ ඝාතනයේ විසි එක් වන සංවත්සරය නිමිත්තෙනි**

අසූව දශකයේ මැද භාගයේ දී කොළඹ විශ්ව විද්‍යාලයේ ස්වාධීන ශිෂ්‍ය සංගමයේ නායකයා ලෙස කටයුතු කළ දයා පතිරණ ව කපා කොටා ඝාතනය කර දමා තිබුනේ අදින් වසර විසි එකකට පෙර 1986 දෙසැම්බර් මස 15 වන දින උදුවප් පුර පසළොස්වක පොහෝ ද ය. මෙම ඝාතනය කරුණු කිහිපයක් නිසා වැදගත් එකක් විය. ඉන් වසර දෙකහමාරකට උඩ 2004 ජූලි මාසයේ දී, පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ පද්මසිරි අබේසේකර සහ කොළඹ විශ්ව විද්‍යාලයේ රෝහණ රත්නායක ශිෂ්‍යයන් දෙදෙනා රාජ්‍ය සේවයේ වෙඩි උණ්ඩයෙන් මිය ගොස් තිබුනු බැවින් තවත් සරසවි සිසුවෙක් මරා දමා තිබීම එවකට එතරම් විශාල කලබගෑනියක් ඇතිවීමට හේතුවක් නොවීය. නමුත් මෙම මිනී මැරුම එසේ අයාලේ ගිය සතුරු වෙඩි උණ්ඩයකින් සිදුවූවක් නොව මිතුරු ලෙසින් පැමිණි මාරයාගෙන් ලැබුනු පිහි පහරින් සිදු වූ එකක් වීම විශේෂයකි. ඒ සමගම වැදගත් කරුණ නම්, එතැන් සිට ඇරඹී වසර කිහිපයක් පුරා ශ්‍රී ලංකාව වෙළාගත් මිනිස් ඝාතන සංස්කෘතියේ ප්‍රථම බිල්ල මෙය වීමයි.

මේ ඝාතනයට මූලික ම හේතුව ලෙස මතුපිටින් පෙනුනේ කොළඹ සරසවියේ ශිෂ්‍ය නායකත්වය පිළිබඳ බල අරගලය වූව ද, සැබෑ වූ හේතුව වූයේ උතුරේ උද්ධය සහ ජනවාර්ගික ප්‍රශ්ණය පිළිබදව වූ වඩා පුළුල් මතවාදී ගැටුමක් බව මගේ හැඟීමයි. එනිසාම මෙම ඝාතනය පසු කාලයේ ලංකාව තුල උතුරු නැගෙනහිරින් බාහිරව සිදු වූ මහා ජීවිත විනාශයේ සමාරම්භක මිනිස් බිල්ල ලෙස හඳුන්වා දීම ඉතා වැදගත් වේ.

මේ ලිපියේ අරමුණ වන්නේ දයා පතිරණ ඝාතනය සහ ඊට පෙර හා ඉන් පසු කාලයේ ශිෂ්‍ය දේශපාලනය පිළිබඳ මගේ මතකයේ ඇති කරුණු කිහිපයක් මේ ගැන උනන්දුවක් දක්වන්නන් ගේ ප්‍රයෝජනය පිණිස සටහන් කිරීමයි. මේ පිළිබඳ මගේ එක් තර්කයක් චක්‍රාකාරව කියා පෑම සඳහා මවිසින් රචිත කවි පද කිහිපයක් උපයෝගී කර ගැනීමට ද අදහස් කරමි.

දයා පතිරණ (ඔහු ගේ මුළු නම හේවා පතිරණගේ දයානන්ද පියසිරි විය) මට මුලින්ම හමුවූයේ 1984 අගෝස්තු මාසයේ දිනයක කඩවත සූරිගම පන්සලක පැවැත්වුනු අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මංඩල (අවිශිබම) රැස්වීමේ දීය. (පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ අපි අවිශිබමය හැඳින්වූයේ අයි.යූ.එස්.එෆ්. යන මුළකුරු වලින් වුවද එය අනෙකුත් විශ්ව විද්‍යාලවල ජනප්‍රිය වූයේ අන්තරය යන නමිනි). අවිශිබමයේ කැඳවුම්කරු ලෙස එවකට ක්‍රියා කළේ පසුව ජනතා විමුක්ති පෙරමුණේ (ජ.වි.පෙ.) මධ්‍යම කාරක සභිකයෙකු වූ උපාලි ජයවීර ය. කැළණිය විශ්ව විද්‍යාලයෙන් ඔහුට අමතරව මහජන පක්ෂය, ශ්‍රීලනිපය සහ නව සමසමාජ පක්ෂය නියෝජනය කරන ශිෂ්‍ය නියෝජිතයන් ද එදින කුමන පක්ෂයක් නියෝජනය කළේ දැයි මා අදත් නොදන්නා, පසුව 1994 දී ශ්‍රී.ල.නි.ප. යෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වුනු, ඩිලාන් පෙරේරා ද සහභාගී විය. (ඩිලාන් එවකට ජ.වි.පෙ. හිතවාදියෙක් වූ බව මම අනුමාන කරමි. මා ඔහු අවසාන වරට සජීවීව දුටුවේ 1985 මැයි දිනයේ කොළඹ නව නගර ශාලාවේ පැවති නිල නොවන ජ.වි.පෙ. මැයි දින රැලියේ දී සිය පියාත්, නැගණියත් සමග සිටියදී ය. ඩිලාන් අද ද ශ්‍රී ලංකා දේශපාලනයේ දී ජනවාර්ගික ප්‍රශ්ණය වැනි ඇතැම් කරුණු සම්බන්ධයෙන් එහි ප්‍රගතිශීලි සුළුතරය නියෝජනය කරනු දැකීම සතුටට කරුණකි.) කොළඹ, මොරටුව, ජයවර්ධනපුර, පේරාදෙනිය සහ රුහුණ විශ්ව විද්‍යාල ද අඩු වැඩි වශයෙන් නියෝජනය වී තිබුනි. රැස්වීමට සහභාගීවූවන් බහුතරය එක්කෝ ජ.වි.පෙ. ක්‍රියාකාරිකයින් හෝ නැතිනම් ජ.වි.පෙ. අනුගාමිකයින් (එනම් විශ්ව විද්‍යාලයට පරිබාහිර ජ.වි.පෙ. දේශපාලනයට ද යම් ලෙසකින් දයක වෙන්නන්) හෝ නැතිනම් ජ.වි.පෙ. හිතවාදීන් (එනම් එවකට ශිෂ්‍ය දේශපාලනය තුල ජ.වි.පෙ. ක්‍රියාකාරීත්වය පිළිබඳ බරපතල ප්‍රශ්ණ නැත්තන් - සමහරවිට ඩිලාන් පෙරේරා මේ ගොඩට වැටුනා විය හැක.) බව කැපී පෙනුනි. යාපනය සහ නැගෙනහිර සරසවිය ප්‍රායෝගික කරුණු මත අවිශිබම ට අඩංගු නොවීය.

එහි පැමිණ සිටි අය අතර සිහින් සිරුරකින් ද බොකුටු කොණ්ඩයකින් ද යුතු කොළඹ විශ්ව විද්‍යාලයේ දයා පතිරණ කැපී පෙනුනි. ඔහු ජ.වි.පෙ. හිතවාදියෙක් නොවන බව ක්ෂණයකින් පැහැදිලි වූයේ ඔහු කවුරු දැයි කැඳවුම්කරු ද ඇතුළුව සභාවෙන් ප්‍රශ්ණ නැගුණු විටය. තමා කොළඹ සරසවියේ ස්වාධීන ශිෂ්‍ය කණ්ඩායම නියෝජනය කරන බවත්, පසුගිය දිනක පැවති ජල බදු විරෝධී රැලියේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් නියෝජනය කරමින් කතා කළ තමා ට මෙම අවිශිබම රැස්වීමට සහභාගීවීමට අයිතියක් තියෙන බවත් දයා පතිරණ ස්ථිරසාරව ප්‍රකාශ කළේ ය.

එතැන් පටන් වසරක පමණ කාලයක් තුල මා ඔහු කිහිප වරක් දැක, කතා බහ, සාකච්ඡා කර තිබුනද, මා දයා පතිරණ පිළිබඳව පෞද්ගලික තොරතුරු දැන සිටියේ ඉතා අල්ප වශයෙනි. ඔහු ගේ මරණයෙන් පසුව මා දැනගත් පරිදි දයා පතිරණ මාතර ප්‍රදේශය තම නිජබිම කරගත්තෙකි. ඔහු පාසැලේ දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයෙක් වූ බව ද කියවුනි.

කූප්‍රකට භීෂණ සමය මේවන විට ලංකාවේ තවමත් ආරම්භ වී නොතිබුන ද මෙම අවිශිභම රැස්වීම පැවැත්වූ කාලය ද විශ්ව විද්‍යාල සිසුන් ට නම් එක්තරා ආකාරක භීම සමයක් විය. පෙර සඳහන් කළ පරිදි පද්මසිරි අබේසේකර සහ රෝහණ රත්නායක ශිෂ්‍යයින් වෙඩි තියා මරා දමා ඒවන විට ගතවී තිබුනේ යාන්තම් මසක් පමණ කාලයක් පමණි. මේ රෝහණ රත්නායක ශිෂ්‍යයා දයා පතිරණ නායකත්වය දුන් කොළඹ විශ්ව විද්‍යාලයේ ස්වාධීන ශිෂ්‍ය සංගමයේ අනුගාමිකයෙක් වූ වා යැයි මම සිතමි. මේ වන විට විශ්ව විද්‍යාල සියල්ල ම වසා දමා තිබුනු අතර අප එද රැස්වුනේ ශිෂ්‍ය විරෝධය ඉදිරියට ගෙනයාමත්, විශ්ව විද්‍යාල නැවත විවෘත කරගැනීමත්, පේරාදෙනිය විශ්ව විද්‍යාලය තුල පිහිටුවා තිබූ පොලිස් ස්ථානය ඉවත්කරවා ගැනීමත් පිළිබඳ සාකච්ඡා කිරීමටය. මගේ මතකයට අනුව රැස්වීම අවසාන වූයේ, එවකට පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ පිහිටුවා තිබූ පොලීසිය එතැනින් ඉවත් කරන ලෙස රජයට බල කිරීම පිණිස, පොදු ජන පෙත්සමක් අත්සන් කිරීමට තීරණය කිරීමත් සමගය.

වසා දමා තිබූ පේරාදෙනිය විශ්ව විද්‍යාලය නැවත ආරම්භ වන විට ඒ තුල පිහිටුවා තිබූ කූප්‍රකට පොලිස් ස්ථානය රජය විසින් ඉවත් කර ගෙන තිබුනි. අබේසේකර සොයුරා මරා දැමූ දින රාත්‍රියේ ඉබේම වාගේ ඇරඹුණු ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුව (ඇක්ෂන් කොමිටිය හෙවත් ඒ.සී. එක) විශ්ව විද්‍යාල පාලන අධිකාරිය සමග යම් සුහදතාවයකින් ද ඇති කර ගනිමින් 1983 ජූලියේ සිට තහනම් කර දමා තිබූ මහා ශිෂ්‍ය සභාවේ අඩුව පිරිමැසීය. ශිෂ්‍ය සභා වෙනුවට උප කුලපති ගේ සභාපතිත්වයෙන් යුතු ශිෂ්‍ය සම්බන්ධතා කමිටු ද, උපකුලපති පත් කිරීම ආචාර්වරුන්ගේ ඡන්දයෙන් නොව උසස් අධ්‍යාපන ඇමති විසින් සිදු කිරීම ද නීතිගත කරන උසස් අධ්‍යාපන සංශෝධන පනත 1985 ජනවාරියේ රජයෙන් සම්මත කෙරිනි. මෙයට විරුද්ධව අවිශිබම මගින් විශ්ව විද්‍යාල පුරාත් රට පුරාත් මහා විරෝධතා ව්‍යාපාරයක් දියත් කරන ලදී. මේ කාලයේ විටින් විට දයා පතිරණ හමුවෙන්නටත් ඔහු ගේ දේශපාලය කුමක් දැයි අඳුනා ගන්නටත් මට හැකිවිය.

දයා පතිරණ සහ කොළඹ විශ්ව විද්‍යාලයේ ස්වාධීන ශිෂ්‍ය සංගමය, ජනතා විමුක්ති පෙරමුණ ට සම්බන්ධ වූ සමාජවාදී ශිෂ්‍ය



දයා පතිරණ අවසන් ගමනේ

සංගමයෙන් කරුණු කිහිපයක් නිසා වෙනස් විය. සමාජවාදී ශිෂ්‍ය සංගමය මුළු රට පුරා ව්‍යාප්ත වී තිබුනු අතර ස්වාධීනයෝ කොළඹ විශ්ව විද්‍යාලයට පමණක් සීමා වූ කුඩා කණ්ඩායමක් වූහ. එසේ වූව ද, සමහර විට එ නිසාම, නයි-මුගටි සටනින් කොළඹ දී එවකට ජයගත්තෝ මුගටියෝ වූහ. මේ නයි-මුගටි වෛරයට පාදක වූ මූලික දේශපාලන වෙනස් කම වූයේ මේ දෙපිරිස ජනවාර්ගික ප්‍රශ්ණය සහ උතුරේ සටන පිළිබඳ දැක්වූ ප්‍රතිවිරුද්ධ අන්ත දෙකේ මතවාදයන් වේ. ස්වාධීන කණ්ඩායම දෙමල ජනතාවගේ ස්වයං නීර්ණ අයිතිය වෙනුවෙන් පෙනී සිටි දේශපාලන ප්‍රවාහය නියෝජනය කළේ ය. ජ.වි.පෙ. මතවාදය මීට ඉඳුරාම වෙනස් එකක් විය. ශිෂ්‍ය දේශපාලනය ට මෙය කෙලින් ම සම්බන්ධ ප්‍රශ්ණයක් නොවූයෙන් බොහෝ පොදු කරුණු වලදී යම්තාක් දුරකට එකට වැඩ කිරීම මේ දෙපිරිසට ප්‍රශ්ණයක් නොවීය. නමුත් උතුරේ යුද්ධය අද ද රටේ සෑම සංසිද්ධියකට ම කෙලින් ම හෝ චක්‍රාකාරව හෝ බලපාන්නා සේ ම විටින් විට මේ දේශපාලන වෙනස්කම ඉස්මතු නොවූවා නොවේ.

අබේසේකර සහ රත්නායක සිසුන් දෙදෙනා මරා දැමීම ට වසරකට පෙර 1983 ජූලි යේ දී, පේරා-දෙනිය විශ්ව විද්‍යාලයේ පැවති ශිෂ්‍ය සටනක් අවසානයේ මාරාන්තික උපවාසයක් ඇරඹුනි. වෙනම ම ලිපියකින් විස්තර කළ යුතු මේ සිදුවීම් මාලාව පිළිබඳව මා ලියූ දිගු කවියක් අවසාන කළේ මෙලෙස ය.

අසාධාරණයෙ අඳුර බිඳින්නට
හිරු පායන තෙක් සිටි කාලය ඇති
බලහත්කාරෙන් හෝ හිරු පුබුද
හෙට මුළු ලෝකය එළිය කළ යුතුය

මෙම කවිය අනිවාර්යයෙන් ම නිර්ධන පන්තියේ විප්ලවය සනිටුහන් කරයි. ඉංජිනේරු පීඨ කලා කවය මගින් පවත්වා ගෙන යනු ලැබූ බිත්ති පුවරුවේ මුල් වරට ප්‍රදර්ශනය වූ මෙම කවිය මම පසුව (1984 ඔක්තෝබරයේ පමණ) අක්බාර්-නෙල් ශාලාවේ මා නැවතී සිටි කාමරයේ කුරුටු ගීයක් ලෙසින් සටහන් කළෙමි. ඊලඟ වසරේ මේ කාමරයේ තාවකාලිකව නවාතැන් ගත් ජ.වි.පෙ. ක්‍රියාකාරිකයෙක් මේ කුරුටු ගීය කියවා බලා, මා ගැන විපරම් කර ඇත. මා එවකට ශිෂ්‍ය ව්‍යාපාරය තුල යම් කිසි ආකාරක ක්‍රියාකාරිකයෙකුව සිටියෙමි. ශිෂ්‍ය සටන් තුල සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරකම් පිළිබඳව මගේ අවුලක් නොතිබුනු නමුත් ජනවාර්ගික ප්‍රශ්ණය පිළිබඳව රෝහණ විජේවීර ගේ කතා ඇතුලත් කැසට් සහ ඔහුගේම ජාතික ප්‍රශ්ණයට විසඳුම කුමක් ද නමින් පලකළ පොත මගින් ඉදිරිපත් කරණ ලද මතවාදය නම් මට රුචි නොවීය. මේ සියළුම හේතු නිසාවෙන් දෝ, මට නිසි මග පෙන්වා දීමට ජ.වි.පෙ. නියෝජිතයෙකුට අවසර දෙන්න යැයි මා මිතුරෙක් මගෙන් ඉල්ලීය. මා එයට කැමැත්ත දුනිමි. මේ දේශපාලන සාකච්ඡාව සඳහා මා හමුවට ආවේ අන් කිසිවෙකු නොව පසුව ජ.වි.පෙ. දේශපාලන මංඩල සභිකයෙකු වූ උපාලි ජයවීර ය.

ඉහත කවියෙන් මුළු ගැන්වුනු මගේ අදහස් වල වැරදි බව ගැන පවසමින් කතාව ඇරඹූ ඔහු, පැය දෙකකටත් වඩා වැඩි කාලය කාලයක් මිඩංගු කරමින් ජාතික ප්‍රශ්ණය පිළිබඳ ජ.වි.පෙ. මතවාදය මා හමුවේ තැබීය. ඔහු පැවසූ දේ සැකෙවින් කිවහොත් එය මෙසේ ය. පවතින රජයේ බලයෙන් මිදී තමන් ගේ රජයක් අවි බලයෙන් ගොඩ නැඟීම අරමුණු කරගෙන එවකට උතුරේ කෙරෙමින් පැවතුන සටන ප්‍රතිගාමී එකකි. එනම් බලහත්කාරෙන් හිරු පිබිදවීමට දරන තැතකි. ත්‍රස්තවාදයකි. එය පරාජය කළ යුතුය. අවසානයේ තර්කයෙන් කිසිදු ජයක් ලබා නොගත්ත ද උපාලි ජයවීර වෙන්වී ගියේ නැවත හමුවෙන්නට අවශ්‍ය බව කියමිනි. කෙසේ වෙතත් මා වැනි සුඹුලෙකු ගැන වෙහෙසීමට වඩා වැදගත් වැඩ ඔහුට තිබෙන්නට ඇත.

අබේසේකර සහ රත්නායක සිසුන් දෙදෙනා මරා දමා වසරක් ගතවුනු දින අපි පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ මහා සැමරුම් උත්සවයක් සංවිධානය කළෙමු. මේ වෙනුවෙන් නිකුත් කළ සමරු කලාපයේ සංස්කරණය මට පැවරුණු අතර මගේ කතු වැකියේ අවසානයේ ඉහත සඳහන් කෙටි කව ඇතුලත් කළෙමි. මේ උත්සවයේ දී දයා පතිරණ ද කතා කළේය. ඔහු ගේ කතාවෙන් මා උගත් එක් අළුත් කරුණක් වූයේ ශිෂ්‍ය ව්‍යාපාරය සුළු ධනේෂ්වර බලවේගයක් ය යන සත්‍යයයි. මා එතෙක් කල් සිතා සිටියේ ශිෂ්‍යයෝ නිර්ධන පන්තිය නියෝජනය කරන කොටසක් කියා ය. එය කෙසේ වෙතත් අපේ සමරු කළාපයේ පිටපතක් මෙදින දයා පතිරණ අතට පත්වෙන්නට ඇත.

පෙර සඳහන් කළ උසස් අධ්‍යාපන නව සංශෝධන පනත ට විරුද්ධව කෙරුණු සටන, මාර්තු මාසයේ පරාජිතව අවසාන වීමෙන් පසු මුළු 1985 වසර පුරාම පොදු ශිෂ්‍ය සටන් නොදැ-වුළුනි. ඒ අඩුව පිරිමහන්නට දෝ, විශ්ව විද්‍යාල මට්ටමෙන් ශිෂ්‍ය ප්‍රශ්ණ මතුවෙන්න ට විය.